www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ෆ්‍රැන්ක්ෆට් ගුරුකුලය, පශ්චාත් නූතන වාදය සහ ව්‍යාජ වමේ දේශපාලනය: මාක්ස්වාදී විවේචනයක් කෘතියේ පෙරවදන

***Foreword to The Frankfurt School, Postmodernism and the Politics of the Pseudo-Left: A Marxist Critique***

**ඩේවිඩ් නෝර්ත් විසිනි**

**2015 ජූලි 21**

ලෝක සමාජවාදී වෙබ් අඩවිය මෙහි පලකරන්නේ ඩේවිඩ් නෝත් විසින් රචිත නව කෘතිය වන ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය, පශ්චාත්-නූතනවාදය හා ව්‍යාජ-වමේ දේශපාලනයඃ මාක්ස්වාදී විවේචනයක් සඳහා ලියූ පෙරවදන යි. කෘතිය මේරිං ප්‍රකාශකයන්ගෙන් මිලට ගත හැක. සම්පූර්න පෙරවදනේ පීඩීඑෆ් ලිපිය මෙහි දී බාගත හැකි ය.

මෙම කෘතිය මාක්ස්වාදී න්‍යාය සහ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ විප්ලවවාදී ක්‍රියාමාර්ගය, ඉදිරි දර්ශනය සහ භාවිතය වර්ධනය කිරීම අතර සම්බන්ධතාවය විභාග කරයි. මෙම සන්දර්භය තුල, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව විසින්, වර්තමානයේ පවතින නානාප්‍රකාර සුලු ධනේශ්වර ව්‍යාජ වාම හා සමාජවාද විරෝධී දේශපාලන ප්‍රවනතාවන්ට න්‍යායික පදනම් සම්පාදනය කරන ප්‍රති-භෞතික වාදී සහ ප්‍රති-මාක්ස්වාදී බුද්ධිප්‍රවනතාවන්ගේ - ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය සහ පශ්චාත් නූතන වාදයේ විවිධ අංශ වලට සම්බන්ධ අස්තිත්වවාදී අහේතුක වාදය - ප්‍රතිගාමී ස්වභාවය එලිදරව් කිරීමට සැලකිය යුතු කාලයක් සහ ශක්තියක් යොදනු ලැබ ඇත්තේ මන් ද යන්න එය පැහැදිලි කරයි.

ජාත්‍යන්තරව වඩාත් පතල ව්‍යාජ වාම සංවිධානය නම් සිරිසා නමැති ග්‍රීක පක්ෂයයි. කප්පාදුවට එරෙහි මහජන ව්‍යාපාරය නොමග යවමින්, දිරි සුන් කර පාවාදෙන, පුහු ජනතාවාදී වැකි වමාරන මේ ජාතියේ සුලුධනේශ්වර ව්‍යාපාරයක් බලයට පැමිනි කල ඇති වන්නාවූ දේශපාලන ව්‍යසනය පිලිබඳ තුච්ඡ නිදර්ශනයකි, 2015 ජනවාරියේ දී පවත්වන ලද මැතිවරනය දිනා බලයට පත් සිරිසා ආන්ඩුව ඉටුකල භූමිකාව. ග්‍රීසියේ වැඩකරන ජනතාවට ද, තරුනයින්ට ද සිරිසාවේ සාපරාධී පාවාදීමෙන් ඉක්බිත්තේ උදාකල සියලු ඛේද ජනක ප්‍රතිවිපාක සමග ගත් කල, ව්‍යාජ වම විසින් නගාසිටුවන ලද ප්‍රතිමාක්ස්වාදී න්‍යාය සහ ප්‍රතිගාමී පන්ති ආසක්තයන්ගේ සමකාලීන රූපාකාරයන් අතර සමීප සම්බන්ධතාවය පිලිබඳ මෙම වෙලුමේ විශ්ලේෂනය බෙහෙවින් කාලෝචිත ය.

### ස්ටයිනර් සහ බ්‍රෙනර්ඃ සුලු ධනේශ්වර ව්‍යාජ වාම වාදයේ සමාජ හා දේශපාලන රෝග විනිශ්චය පිලිබඳ විෂය අධ්‍යයනයක්

මෙම වෙලුමේ ප්‍රථම ලිපි තුන ලියන ලද්දේ, ඇමරිකා එක්සත් ජනපදයේ සමජවාදී සමානතා පක්ෂයේ ද හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ද න්‍යායික පදනම්, ඉදිරි දර්ශන සහ භාවිතයට එරෙහිව, ඇමරිකානු ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ හිටපු සාමාජිකයන් දෙදෙනෙකු වන ඇලෙක්ස් ස්ටයිනර් සහ ෆ්‍රැන්ක් බ්‍රෙනර් විසින් එල්ල කල ප්‍රහාරයන්ට ප්‍රතිචාර හැටියටය. ඔවුන් දෙදෙනාම වර්කර්ස් ලීගය (සසප පූර්වගාමියා) හැර ගියේ 1970 ගනන්වල දී ය යන්න සලකා බලන කල්හි, අපට ඔවුන් ගේ ලියවිලි නොසලකා හරින්නට හැකිව තිබුනි. මොවුන් මෙයට ශතවර්ෂ කාලකට තරම් පෙර ව්‍යාපාරය හැර ගියවුන් යයි සලකන කල්හි සසප, ක්ෂනික දේශපාලනික නට්ටම් වීමකට ලංව තිබුනේ ය යන ස්ටයිනර් සහ බ්‍රෙනර් ගේ අනතුඅරු හැගවීම, දේශපාලනික විශ්වසනීය භාවයෙන් තොර වූ වා පමනක් නොව සදාචාරාත්මක බලපෑමකින්ද තොර විය. නිශ්චිත වගකීමක් නො ඇඟවූ, පක්ෂයේ හිතවතුන් ය යන පදයෙන් ඔවුන් තමන්ව හඳුන්වාගැනීම - ඔවුන්ගේ වඩ වඩාත් උග්‍ර අතට හැරෙමින් තිබූ විවේචනයන්ට ප්‍රතිචාර දක්වීමට සසපය බැඳී නොතිබුනි. කෙසේ වෙතත් සැලකිල්ලට ලක්වූ කරුනු දෙකක් නිසා පිලිතුරු දිය යුතු බවට ජාත්‍යන්තර කමිටුව ඒත්තු ගැන්වීය.

පලමුවැන්න, ස්ටයිනර් හා බ්‍රෙනර් වර්කර්ස් ලීගයේ ආරම්භක ඉතිහාසය තුල යම් ක්‍රියාකලාපයක් ඉටුකර ඇතැයි සලකන කල, ඔවුන්ගේ විවේචනයන්ට ප්‍රතිචාර දැක්වීම මගින් ඔවුන්ගේම දේශපාලන වර්ධනයට හා යම් හෝ හැකියාවක් ඇත්නම්, විප්ලවවාදී ව්‍යාපාරයේ වැඩකටයුතු තුල ට ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය දිරිගැන්විය හැකි යයි අප අවංකව විශ්වාස කිරීමයි. එහෙත් කල් නොයවාම පැහැදිලි වූයේ, අපගේ ඒත්තු ගැන්වීමේ උත්සාහයේදී අඩුවෙන්ම පල දරනු ඇත්තේ එය බවය.

දෙවන කාරනාව ඔවුන්ගේ විවේචනයන්හි න්‍යායික සන්දර්භයයි. සමාජවාදී විඥානය යලි පනගැන්වීමට යුතෝපියාව (මනෝ රාජ්‍යය) තීරනාත්මක මන් ද,

වෛෂයිකවාදය හෝ මාක්ස් වාදය සහ හිස හෝ හදවත යන දෙකම නැති කරගත් මාක්ස්වාදය යන ඔවුන්ගේ ප්‍රධාන ලියවිලි සමන්විත වූයේ, මධ්‍යම පන්තික හිටපු - රැඩිකලුන් ද ශාස්ත්‍රාලිකයන් ද පුලුල් ස්ථරයක් අතර ප්‍රචලිත වූ ප්‍රති මාක්ස්වාදී සංකල්ප සමූහයකිනි.

තමන් රකින්නේ ජාත්‍යන්තර කමිටුවේ සම්ප්‍රදායන් බව ස්ටයිනර් සහ බ්‍රෙනර් ප්‍රකාශ කල නමුත් ඔවුන්ගේ ලියවිලි පිලිබඳ අපගේ විශ්ලේෂනය එලිදරව් කලේ, ඔවුන් සිය උත්ප්‍රේරනය ලබාගත්තේ හර්බට් මාකූස් හා ෆ්‍රොයිඩෝ-මාක්ස්වාදීන් වූ විල්හෙල්ම් රීක් සහ එරික් ෆ්‍රොම් ද අර්නස්ට් බ්ලොක් නමැති මනෝරාජිකවාදී (යුතෝපියානු) න්‍යායඥයා ගෙන් ද බවයි.

තමන්ගේ ම මතවාද හා න්‍යායික සහ දේශපාලන මූලාශ්‍ර විචාරාත්මකව හෝ ක්‍රමානුකූලව සොයා යාමට (එසේ කිරීම මාක්ස්වාදීන්ගේ අපෝහක භෞතිකවාදී විධික්‍රමයේ අනිවාර්ය අංගයක් වේ) ස්ටයිනර් සහ බ්‍රෙනර් කිසි විටෙකත් යත්න නොදැරූහ: ඇත්ත වශයෙන් පරම්පරා ගනනාවක ප්‍රතිමාක්ස්වාදීන්ගේ, ඓතිහාසික භෞතික වාදයේ සතුරන්ගේ තර්ක තමන් කොතරම් පිටපත් කරන්නේ දැයි ඔවුන් මුලුමනින්ම වටහා ගෙන නොතිබුනා වීමට හොඳටම ඉඩ ඇත. ඔවුන් විසින් "වෛෂයික වාදය", "නිර්නකවාදය" සහ "ග්‍රාම්‍ය භෞතිකවාදය" හෙලාදකිනු ලැබීම ද ප්ලෙඛනොව්ගේ බුද්ධිමය දායාදයට සහ ලෙනින්ගේ භෞතිකවාදය සහ අනුභූතික විචාරයට නිග්‍රහකිරීම ද බුද්ධිප්‍රබෝධයට සහ තර්ක බුද්ධියට, විද්‍යාවට සහ තාක්ෂනයට ඔවුන් එල්ල කල චෝදනා ද භෞතිකවාදය සහ විඥානවාදය අතර වෙනස බොඳ කර දැමීම ද 'අවිඥානයේ' අර්ථභාරය අධිතක්සේරු කිරීම ද, "අතර්කයේ" අර්ථභාරය හුවාදැක්වීම ද පන්ති සූරාකෑමට එරෙහිව පුද්ගල පරත්වාරෝපනයේ වැදගත් කම ඔසොවාලීම ද මනෝරාජික මිත්‍යා නිර්මානය උත්කර්ශනය කිරීම ද යන මේ සියල්ලේ කිසිදු අපූර්වත්වයක් තිබුනේ නැත.

මුල් ලියවිලි තුන හුදෙක් ස්ටයිනර් ට සහ බ්‍රෙනර් ට පිලිතුරක් පමනක් නොවේ. ඒවා වනාහි සමකාලීන දේශපාලන සහ සංස්කෘතික ජීවිතය මත ප්‍රතිගාමී බලපෑමක් ඇති කරන්නාවූ ද කම්කරු පන්තිය, තරුනයින්, ශිෂ්‍යයන් සහ බුද්ධිමතුන් අවමංගත කර දිරිසුන් කිරීමට නොදරන තැතක් නැත්තාවූ ද දැනට පවතින ප්‍රති-මාක්ස්වාදී ප්‍රභේදයන්ට එරෙහිව එල්ල වූ ලියවිලි වේ.

## අතාර්කිකවාදය සහ ව්‍යාජ වමේ දේශපාලනය

විශේෂයෙන්ම ගත වූ දශකය තුල, නිට්ෂෙ, බ්‍රොසොව්ස්කි, සොරල්, ඩි මැන්, ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය, සහ (ෆොකෝල්ට්, ලැක්ලවු, බදියු, යනාදී) පශ්චාත් නූතන වාදීන් ගේ තවත් බොහෝ ස්වරූප ගත් අන්ත දාර්ශනික ආත්මීයවාදය, සහ අතර්කවාදය සමග බැඳුනු වර්ගය, ජාතිකත්වය, ජනවර්ගය, ලිංගය, සහ ලිංගික නැඹුරුව මත පදනම්වූ මධ්‍යම පන්තියේ ප්‍රතිගාමී ව්‍යාජ වාම දේශපාලනය, සාරභූත සමාජ ප්‍රවර්ගය ලෙස පන්ති භේදය ප්‍රතික්ෂේප කොට ධනවාදය කෙරේ විරුද්ධත්වය යටපත් කරමින්, ඒ වෙනුවට, පෞද්ගලික "අනන්‍යතාව" සහ "ජීවන ශෛලිය" ආදේශ කරමින්, "මානව ඓතිවාසිකම්" වල නාමයෙන් කෙරෙන අධිරාජ්‍යවාදී කඩාවැදීම් සහ යුද්ධ යුක්තිසහගත කිරීමේ ලා තීරක වැඩ කොටසක් ඉටු කර දී ඇත.

න්‍යායික සංකල්ප වර්ධනය වන්නේ ඓතිහාසික, දේශපාලන සහ සමාජ රික්තයක නොවේ. විශිෂ්ට රුසියානු මාක්ස්වාදී ජෝර්ජි ප්ලෙඛනොව්, 1911 ලියූ සමාලෝචනයක දී, ජර්මනියේ ෆ්‍රෙයිබර්ග් සරසවියේ දර්ශනවාදය පිලිබඳ මහාචාර්යවරයෙකු වූ හෙන්රික් රිකර්ට් (1863-1936) ඓතිහාසික භෞතික වාදයට එල්ල කල ප්‍රහාරයකට මෙසේ පිලිතුරු සැපයීය.

> සත්තකින්ම රිකර්ට් සහ ඔහු වැනි වෙනත් විද්‍යාඥයෝ, ඓතිහාසික භෞතිකවාදය පිලිබඳ දැනුම් මාත්‍රයකින් හෝ තොර වෙති. එසේ වන්නේ කිසියම් පුද්ගලික දුබලකමක් නිසා නොව, ඔවුන්ගේ බුද්ධිමය දර්ශනපථය සමස්ත පන්තියකටම සුවිශේෂ වූ දුර්මතයන් ගෙන් වැසී ඇති හෙයිනි. ඔවුන් ගැන සැබවින්ම කිව හැක්කේ, ඔවුන් ඓතිහාසික භෞතිකවදය යයි බෙදාහරින කුනු කන්දල් වනාහි, "මුලුමනින්ම අවිද්‍යාත්මක දේශපාලන අගතියක් බවය." ඓතිහාසික භෞතිකවාදයට ඔවුන් දක්වන සතුරු බව ව්‍යක්තව කියාපාන්නේ, "නියත සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී අපේක්ෂාවන්ට" ඔවුන් තුල ඇති සතුරු කමය. [1]

ස්ටයිනර් සහ බ්‍රෙනර් විසින් ලියා ඇති "කුනුකන්දල්" වනාහි, 1960 සහ 1970 ගනන්වල රැඩිකලීකෘත තරුන ශිෂ්‍ය පරපුරක බුද්ධිමය සහ දේශපාලන විකාශනයේ නිර්මිතයකි.

එම පරම්පරාවේ බොහෝ දෙනකු මෙන් ඔවුහු ද එක්තරා අවස්ථාවකදී මාක්ස් වාදයට ආකර්ශනය වූහ; මාක්ස්වාදය ඔවුන්ට ධනේශ්වර සමාජය ගැන විවේචනය කිරීමට න්‍යායික අත්තිවාරමක් සපයා දුනි. එහෙත් මධ්‍යම පන්තික ශිෂ්‍යයා ගේ "ප්‍රති-ධනවාදය," එහි ස්වභාවයෙන් ම, අවසාන විග්‍රහයේ දී ඉල්ලා සිටියේ, පවත්නා සමාජයට සීමිත ප්‍රජාතන්ත්‍ර ප්‍රතිසංස්කරන වලට වඩා වැඩි නුවූ දෙයකි. ඒ සඳහා උවමනා වූයේ ද අතිශයින්ම දියාරු කරන ලද මාක්ස්වාදයකි. ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ පෙරා, යුරෝපය සහ ඇමරිකාව පුරා සරසවි හරහා අලෙවි කැරුනේ, අතිශයින්ම සැර බාල දියාරුවකි. හයිඩෙගර්

යටතේ ලද පුහුනුවේ මැකිය නොහැකි අඩයාලම දරා සිටි න්‍යායික කෘතීන් නිර්මානය කල හර්බට් මාර්කුස්, බෙහෙවින් ම ජනප්‍රිය වූයේ, අස්තිත්වවාදී මනෝවිග්‍රහයෙන් ලොකු වඩියක් මාක්ස්වාදය ට කලවම් කිරීම මගිනි. මධ්‍යම පන්තික සිසුන් අතර ගැඹුරු ප්‍රතිචාරයක් ලත් ප්‍රශ්න වූයේ, කම්කරු පන්තිය ගොදුරු කර ගන්නා ආර්ථික සූරාකෑම සහ බලය අල්ලා ගැනීමේ කම්කරු පන්ති අරගලය ට සම්බන්ධ කරුනු නොව, පරාරෝපනය, අවරෝධනය සහ ලිංගිකත්වය පිලිබඳ ගැටලු ය.

නිව් යෝර්ක් නගරයේ සමාජ පර්යේෂන සඳහා නව පාසැලේ උපාධි ධරයෙකු වූ ස්ටයිනර් සම්බන්ධයෙන් සලකන කල, ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ බලපෑම නිසැකව ම ඔහුගේ මාක්ස් වාදී සංකල්ප හැඩගැස්වූවා සේම, ඔහු 1971 දී වර්කර්ස් ලීගයට එක්වූ පසුව පවා එම බලපෑම දිගටම ඔහුගේ චින්තනය මත අනුහස ද පැවැත්වීය. බ්‍රෙනර් වර්කර්ස් ලීගයේ සාමාජිකයෙකුව සිටියදී ඔහු කෙරේ එම බලපෑම එතරම්ම පැහැදිලිව නොපෙනුනේ නම් ඒ, ඔහු න්‍යායික ප්‍රශ්න කෙරේ දැක්වූ උනන්දුව එතරම්ම විශද නොවූ නිසා පමනි.

කෙසේ වුවද යුද්ධය අවසන් වීම, තරුනයින් අනිවාර්යයෙන් යුද්ධයට බඳවාගැනීම නවතාලීම, හා 1973දී එක්සත් ජනපදය වියට්නාම් යුද්ධයෙන් ඉවත් වීම ආරම්භ වීමත් සමග ශිෂ්‍ය විරෝධතා ව්‍යාපාරය බිඳ වැටීම, ස්ටයිනර් සහ බ්‍රෙනර් යන දෙදෙනාම දිරි බිඳ උකටලී බවට පත් කලේය. 1978 හා 1979 මුල මාස කිහිපයක් ඇතුලත මේ දෙදෙනා වර්කර්ස් ලීගයෙන් ඉවත් වීම, හුදෙක් පෞද්ගලික පලායාමක් වූයේ නැත. එය පෙන්නුම් කලේ, යුද විරෝධී ව්‍යාපාරයේ ප්‍රධාන රැල්ල බවට පත්ව සිටි මධ්‍යම පන්තික ශිෂ්‍යයන් ගේ දක්ෂිනාංශික විකාශයයි.

දෙදෙනාම වර්කර්ස් ලීගයෙන් පලායාමේ ප්‍රතිඵලයක් වශයෙන්, ජාත්‍යන්තර කමිටුවේ බ්‍රිතාන්‍ය ශාඛාව වූ කම්කරු විප්ලවවාදී පක්ෂයේ ද එහි චිර කාලීන නායක ජෙරී හිලීගේ ද උග්‍ර වන්නට පටන්ගෙන තිබුනු අවස්ථාවාදී දේශපාලනයට එරෙහිව, 1980 ගනන් ආරම්භයේදී වර්කර්ස් ලීගය විසින් අරඹන ලද අරගලය තුල, ස්ටයිනර් සහ බ්‍රෙනර් කිසිදු ප්‍රතිපදානයක් නොකලහ. හීලි විසින් ආත්මීය විඥානවාදී ආකාරයකින් අපෝහක භෞතිකවාදය මුසාකරනය කිරීම ට එරෙහිව වර්කර්ස් ලීගය කල සවිස්තර විවේචනයට, ඔවුහු මුලුමනින්ම ආගන්තුක වූහ. 1985 ශරත් සමයේ අග ජාත්‍යන්තර කමිටුව තුල භේදය පිලිබඳ තොරතුරු ප්‍රසිද්ධ වත්ම, ස්ටයිනර් වර්කර්ස් ලීගය සමග සම්බන්ධතා යලි ඇතිකර ගත්තේ ය. වර්කර්ස් ලීගය තීරක භූමිකාවක් ඉටු කල, ජාත්‍යන්තර කමිටුව විසින් කර ගෙනයනු ලැබූ දේශපාලන සහ න්‍යායික අරගලය කෙරේ එකඟතාවය පලකරමින් ස්ටයිනර්, පක්ෂයේ ආධාර කරුවෙකු වන බව කියා සිටියේ ය. කෙසේ වෙතත්, (ඔහු අවංකවම පිලිගත් පරිදි) ගෙවී ගිය අවුරුදු කිහිපය තුල ගොඩ නගාගෙන තිබුනු සුව පහසු මධ්‍යම පන්තික ජීවන රටාව අවුල් කර ගැනීමට කැමැති නොවූ ස්ටයිනර්, පක්ෂයට ඇතුලු නොවීමට තීන්දු කලේය.

1990 ගනන්වල අග පක්ෂයට වඩාත් සමීප වන බවක් පෙනී ගිය ස්ටයිනර්, සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජිකත්වය ඉල්ලා සිටියේය. කෙසේ වෙතත් අපට පෙනීගියේ, ඔහු කව්ප සමග භේදය අවධියේ සටන්වැද පැහැදිලි කර ගැනුනු න්‍යායික සහ දේශපාලන ප්‍රයුක්තයන් පරෙස්සමින් අධ්‍යයනය කර හා එහෙයින්ම ඒවා උකහාගෙන නොතිබුනු බව ය. සසප ඔහු ඇතුලු කර නොගැනීමට තීන්දු කලේ ය. එහෙත් අපි ඔහු සමග හිතවත් සම්බන්ධතාවක් පවත්වාගෙන ගියෙමු. "ඇලෙක්ස් ස්ටයිනර්ගේ දේශපාලන හා බුද්ධිමය චාරිකාව" යන දිගු නිබන්ධයක් මෙම වෙලුමට අන්තර්ගත වේ. එහිදී ස්ටයිනර් සමග න්‍යායික ව්‍යාපෘතීන්හිදී සහයෝගීව කටයුතු කිරීමේ ක්‍රම සොයාගැනීමට සසප දැරූ ඉවසිලිමත් උත්සාහය විමසා බැලේ.

## ඉරාක යුද්ධය සහ සුලු ධනේශ්වර වම

මෙම ප්‍රයත්නයන් අවසාන කර දැමුනේ, ඇමරිකාව තුලත් ජාත්‍යන්තරවත් දේශපාලන තත්වයේ ඇතිවූ තියුනු වෙනස් කම් විසිනි. ප්‍රථම ලියවිල්ල ස්ටයිනර්ට ලියන ලද්දේ 2013 ජුලි මාසයේ දී එක්සත් ජනපදය විසින් ඉරාකය ආක්‍රමනය කොට යාන්තම් මාස 3ට පසු ය. ස්ටයිනර් සහ බ්‍රෙනර්ට මා ලියූ අවසන් ලිපිය පලකරන ලද්දේ, 2008 ඔක්තෝබරයේ වෝල් වීදියේ බිඳ වැටීමට සති කිහිපයකට පෙර හා බරක් ඔබාමා තෝරාපත් කර ගැනීමට සති කිහිපයකට පසුව ය. මේ අවුරුදු පහ තුල, 1960 ගනන් වල පැනනැගි මහා සමාජ ව්‍යාපාර තුලින් හිස එසවූ පැරනි මධ්‍යම පන්තික විරෝධතා ව්‍යාපාරයන්හි නටබුන් වල දේශපාලන දිශානතියේ ප්‍රගාඪ මාරුවක් සිදු විය.

ඉරාක යුද්ධය සූදානම් කෙරෙමින් පැවති සති වලදී ලෝකය වටා යුද විරෝධී මහජන පෙලපාලි පැවැත්විනි. එහෙත් යුද්ධය ආරම්භ වූ වහාම ඒවා අවසන් වූ අතර යලි ඇරඹුනේ ද නැත. ප්‍රථම අප්‍රිකානු-ඇමරිකානු ජනාධිපති ලෙස ඔබාමාගේ පත්වීම, සුලු ධනේශ්වර වම ඇමරිකානු දේශපාලනයේ ප්‍රධාන ධාරාව තුලට ඒකාග්‍ර කර ගැනීම සඳහා දේශපාලන යුක්තිකරනය සම්පාදනය කලේය. පැරනි විරෝධතා ව්‍යාපාරයන්ගෙන් සැලකිය යුතු කොටසක්, විශේෂයෙන්ම පෝසත් මධ්‍යම පන්ති පසුබිමකින් සාමාජිකයන් ඇදගත් සංවිධාන, දේශපාලන රැඩිකල්වාදයෙන් බිඳී වෙන්වී, සමාජවාද විරෝධී සහ අධිරාජ්‍ය ගැති ව්‍යාජ වමක් බවට පරිවර්තනය වීමේ සිය දීර්ඝ සන්තතිය සම්පූර්න කලෝය.

ස්ටයිනර් සහ බ්‍රෙනර් මෙම දකුනු මාරුවට හසුවූහ. 2003 මාර්තුවේදී ස්ටයිනර්, ලෝක සමාජවාදී වෙබ් අඩවිය

සහ සමාජවාදී සමානතා පක්ෂය විසින් කැඳවන ලද ප්‍රසිද්ධ යුද විරෝධී සම්මේලනයකට සහභාගී වෙමින්, එහි ආස්ථානයන්ට පක්ෂව කතා කලේ ය.

අවුරුදු පහක් ගත වීමට පෙර ඔහු සමාජවාදී සමානතා පක්ෂයේ ද ජාත්‍යන්තර කමිටුවේ ද මරනය ප්‍රකාශයට පත් කරන්නට විය. එම අවුරුදු පහ තුල ජාත්‍යන්තර කමිටුව තම දේශපාලන ක්‍රියාමාර්ගය වෙනස් කර තිබුනේ නැත. ඇත්ත වශයෙන් සිදු වූයේ සබඳකම් අලුත් කර ගත් මේ දෙන්නා, මාක්ස්වාදී දර්ශනවාදය සහ ට්‍රොට්ස්කිවාදී දේශපාලනය ප්‍රතික්ෂේප කරමින්, ජාත්‍යන්තර කමිටුවට එරෙහි සන්ධානයක් ගොඩනගා ගැනීමයි.

සාවද්‍ය න්‍යාය වෛෂයිකව පල දෙයි. ඔවුන්ට මාක්ස්වාදී න්‍යාය වටහා ගැනීමේලා පැවති නොවිසඳුනු අඩු පාඩු - අන් සියල්ලටමත් වඩා, ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ න්‍යායයඥයන් කෙරේ ඔවුන් දැරූ ආකල්පය - ඔවුන් පන්ති පීඩනයන් ඉදිරියේ බුද්ධිමය වශයෙන් නිරායුධ කලේය. එහෙත් ස්ටයිනර් සහ බ්‍රෙනර් ගේ විකාශනයේ වියුක්ත සහ හුදෙක් බුද්ධිමය ස්වභාවයේ වරද ඉක්මවා ගිය දෝෂ පැවැත්තේය. අවසාන විග්‍රහයේ දී ඔවුන්ගේ දර්ශනයේ වෙනස්කම් ඔවුන්ගේ දේශපාලනය නිර්නය කරනවාට වඩා සිදු වූයේ, ඔවුන්ගේ දේශපාලනයේ වෙනස් කම් ඔවුන්ගේ දර්ශනවාදය නිර්නය කිරීමයි. ස්ටයිනර් සහ බ්‍රෙනර්ගේ දේශපාලනයේ එන්ට එන්ටම වැඩි වූ අප්‍රතිපත්තික සහ අවස්ථාවාදී ස්වරූපය, ඔවුන්ගේ සමාජ වාතාවරනය තුල මුල් ඇද තිබුනු අතර, දාර්ශනික සහ ඓතිහාසික භෞතිකවාදයෙන් බිඳීමට ඔවුන්ට බල කලේ ය. 2003 සහ 2008 අතර සමයේ ඔවුන්ගේ වාතාවරනයේ තියුනු සමාජ දේශපාලන වෙනස්කම් මැද්දෑවේ, සිය ආන්තික දේශපාලන අවස්ථාවාදයේ යුක්ත්‍යාරෝපනය "ෆ්‍රොයිඩො-මාක්ස්වාදීන්ගේ" (මාක්ස්වාදය සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් ගේ මනෝ විද්‍යාව සමග දෙමුහුන් කලවුන්ගේ) දිරි සුන් න්‍යායන් තුල සොයා ගැනීමට ලැබීම ඔවුන් අමන්දානන්දයට පත් කලේය.

ඔවුන්ගේ න්‍යායික ආස්ථානයන්හි අති මූලික උල්පත වූයේ ඔවුන්ගේ පන්ති යොමුවයි. 2006 ජූනියේදී, මා ඔවුන්ගේ තර්ක විතර්ක විග්‍රහ කරමින් පහත සඳහන් අනතුරු ඇඟවීම කලෙමි:

> ඔබගේ විවිධ ලේඛන වල ඉදිරිපත්කර ඇති අදහස් පෙන්නුම් කරන්නේ, ස්ටයිනර් සහ බ්‍රෙනර් සහෝදර වරුනි, ඔබ දෙදෙන මෙයට දශක තුනකට පෙර අපගේ ව්‍යාපාරය හැරගිය තැන් පටන් මාක්ස්වාදයෙන් පිටතට න්‍යායිකව සහ දේශපාලනිකව ගමන් කර ඇති දුර ය. ඔබගේ වත්මන් පථය දිගේ යාගත හැක්කේ, බොහෝ වර්ෂ ගනනකට පෙර ඔබ ප්‍රතිග්‍රහනය කල දේශපාලන ආස්ථානයන් ගෙන් ඉතුරුව ඇති ටික ද මුලුමනින්ම හැරපියා පමනි.

ඔවුන් තම ලේඛනවල ඉලක්කය දර්ශනවාදයේ සිට දේශපාලනයට මාරු කරන විට, ප්‍රති-ට්‍රොට්ස්කිවාදයේ අවිහලෙන් ගත් අවි යොදා ගෙන, ජාත්‍යන්තර කමිටුව ද සසප ද "නිකාය වාදී" යයි හෙලාදැකීමට පටන් ගත්හ. අප කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය ආරක්ෂා කිරීම ද ධනේශ්වර දේශපාලන පක්ෂ වලට සහය දීම ප්‍රතික්ෂේප කිරීම ද ප්‍රහාරයට ලක් කිරීමේදී ඔවුන් යොදාගත් ප්‍රියතම අපවාදය වූයේ මෙයයි.

ඔවුන්ගේ බ්ලොග් අඩවියේ ලිපි පලවන්නේ ඉඳහිට වන හෙයින් ස්ටයිනර් ගේ සහ බ්‍රෙනර් ගේ දේශපාලන විකාශනය පිලිබඳ සමාලෝචනයක් කිරීම අමාරු නැත. සාමාන්‍යයෙන් උදාසීන මේ වෙබ් අඩවියේ අන්තර්ජාල ක්‍රියාකාරිත්වයේ මට්ටම සලකා බලන කල්හි, එහි නිද්‍රාශීලි කතුවරුන්ට හාස්‍ය රසයකුත් තිබෙන බව අඟවන එකම ලක්ෂනය නම්, එයට තෝරාගෙන ඇති නොනවතින විප්ලවය යන නාමය යි.

සතියකට දින හයක් ලිපි සම්පාදනය කරන වාර්ෂිකව ලිපි 5000කට වැඩි යෙන් අන්තර්ජාල ගත කරන ජාත්‍යන්තර කමිටුවේ උදාසීන "කට්ටිවාදයේ වෛෂයික වාදය" හෙලාදකින ස්ටයිනර් සහ බ්‍රෙනර් ගේ බ්ලොග් අඩවියේ අන්තර්ජාල පලකිරීම් අතර මාස ගනන් කාල පරාසයන් පවතියි. විප්ලවවාදී ව්‍යාපාරයක් ගොඩ නැගීම "තීරනාත්මක හදිසි බවක්" අත් කර ගන්නා අතර "අන් කවර කලෙකටත් වඩා, දැනුවත් නායකත්වයක අවශ්‍යතාවය දැන් පැනනැගී ඇති" බව [2] ඔවුන් මෑතදී ප්‍රකාශ කල නමුත්, ඔවුන්ගේ බ්ලොග් අඩවිය ප්‍රමුඛ දේශපාලන සිද්ධීන්ට දක්වන ප්‍රතිචාරය නම් .... නිහැඬියාව යි. ඔවුන් සිය කාලකන්නි දේශපාලන නිද්‍රාවෙන් ඉඳහිට ඇහැරෙතොත් ඒ, ජාත්‍යන්තර කමිටුව හෙලාදැකීමට ද තමන්ගේ දකුනු ගමනේ තවත් සැතපුම් කනුවක් සලකුනු කිරීමටත් ය.

## යුක්‍රේනය

පසුගිය වසර තුල (2014-2015) ස්ටයිනර් හා බ්‍රෙනර්, දක්ෂිනාංශික යුක්‍රේනියානු ආන්ඩුව පිටුපස ගාල්වුන අධිරාජ්‍ය ගැති ව්‍යාජ වම්මුන්ගේ කුලප්පුව සමග පෙලගැසුනහ. 2014 මැයි 20දා පල කල ලිපියක බ්‍රෙනර් ප්‍රකාශ කලේ, "මාක්ස්වාදීන් යුක්‍රේනය කැබලි කිරීමට විරුද්ධ විය යුතුය." අමු නරුමත්වයකින් ඔහු පවසන්නේ, "එහි අර්ථය, රුසියාව හෝ පෝලන්තය හා එහි අධිරාජ්‍යවාදී නේටෝ සහචරයින් වැනි 'වෙනත්' අයගේ කුමන හා සියලු ඈඳාගැනීම් වලට විරුද්ධ වීමයි." [3] බ්‍රෙනර් මෙම පිලිවෙත නිවේදනය කලේ, එක්සත් ජනපදය හා ජර්මනිය කියෙව්හි සැලසුම් කල කුමන්ත්‍රනයෙන් තෙමසකට පසුවය. ෆැසිස්ට්වාදී සංවිධාන විසින් ක්‍රියාවට නගන ලද එම කුමන්ත්‍රනයෙන් යුක්‍රේනය ඈඳා ගැනීමේ අධිරාජ්‍යවාදී

බලවතුන්ගේ සියලු බලාපොරොත්තු හා අරමුනු ඉටුකරන ලදී.

යථාර්ථයේ දී ඇඳා ගැනීමට බ්‍රෙනර් දක්වන විරුද්ධත්වයේ අර්ථය, ක්‍රිමියානු ජනතාව රුසියාව සමග යලි එක් වීමට ගත් තීරනයට එරෙහි වීම යි. දක්ෂිනාංශික කුමන්ත්‍රනයට මෙලෙස රබර් මුද්‍රාව තැබීම සැබවින්ම බ්‍රෙනර් විසින් තවදුරටත් සාධාරනීකරනය කරන ලද්දේ, යුක්රේනයේ ස්වයං-නීර්න අයිතිය ආරක්ෂා කිරීම ලෙසය. "එයින් අදහස් කෙරෙන්නේ හරියට ම එක දෙයකි, එනම් වෙන්වී ස්වාධීන රාජ්‍යයක් තනා ගැනීමට ඇති අයිතියයි. "ස්වයං-නීර්නය" පිලිබඳ බ්‍රෙනර්ගේ සංකල්පයේ එක ම අර්ථය, සමස්ත යුක්රේනය ම කීයෙව් තන්ත්‍රය විසින් පාලනය කිරීම යි. පොරොෂෙන්කෝ ආන්ඩුවට විරුද්ධ වන කොටස්වලට වෙන් වීමට ඇති අයිතිය බ්‍රෙනර් විසින් ප්‍රතික්ෂේප කෙරේ.

ජාත්‍යන්තර කමිටුව, විවිධාකාර උදාහරන පාදක කරගෙන, විශේෂයෙන් ම සෝවියට් සංගමය බිඳ විසිරවීමෙන් පසු කාලයේ ස්වයං-නීර්න අයිතිය සවිස්තර විවේචනයකට භාජනය කොට ඇතඃ එක්කෝ එය, අධිරාජ්‍යවාදී අනුග්‍රහයෙන්, කැබලි කිරීම සඳහා ඉලක්ක කල රාජ්‍යයන්ට මැදිහත් වීමේ යාන්ත්‍රනයකි, නැතහොත් ජාතික ධනේශ්වර ප්‍රභූවේ සුවිශේෂී කොටසක් පොහොසත් කිරීමේ යාන්ත්‍රනයකි. බොහෝ විට එය ඉහත දෙවර්ගයේ ම සංයෝජනයකි. අධිරාජ්‍යවාදයට හා එහි දේශීය අනුගාමිකයන්ට එරෙහි ව, ජාත්‍යන්තර විප්ලවවාදී ක්‍රියාමාර්ගයක පදනම මත සටන් වදින කම්කරු පන්තියේ ඒකාබද්ධ අරගලයකින් තොරව, එම ඉල්ලීමට ප්‍රගතිශීලී අන්තර්ගතයක් නැත. යුක්රේනය පිලිබඳ ව සැලකීමේ දී බ්‍රෙනර් කරන ආකාරයට, ෆැසිස්ට්වාදීන්ගෙන් සැදුම් ලත් හා අධිරාජ්‍යවාදී පිටු බලය ලබන පොරොෂෙන්කෝ තන්ත්‍රයේ දේශපාලන ආධිපත්‍යය සමග ජාතික ස්වයං-නීර්නය අනන්‍ය කිරීම දේශපාලනික ව නින්දිත ය.

## වඩා සාමකාමී අධිරාජ්‍යවාදයක්

සිය සගයා විසින් ආරම්භ කරන ලද අධිරාජ්‍ය ගැති ප්‍රයෝගකාරී අභ්‍යාසය ඉදිරියට ගෙන යමින් ස්ටයිනර්, 2014 සැප්තැම්බරයේදී, "යුද්ධයට එරෙහි අරගලය හා සමාජවාදී සමානතා පක්ෂයේ දේශපාලන කර්තව්‍යයෝ" යන යෝජනාව කෝපයෙන් හෙලා දැක්කේ ය. එම යෝජනාව 2014 අගෝස්තුවේ සසප තුන්වන සම්මේලනයේ දී ඒකමතික ව සම්මත කෙරුනි. ස්ටයිනර් සිය ලිපිය ඇරඹුවේ යෝජනාව තුල වචන යොදා ඇති වාර ගනන -යුද්ධය (97), අධිරාජ්‍යවාදී (23) හා අධිරාජ්‍යවාදය (36) - ගනන් කරමිනි. ස්ටයිනර් සිතනු ඇත්තේ, ලෙනින්, ලක්සම්බර්ග් හා ට්‍රොට්ස්කිගේ ලේඛන තුල මෙම වචන සොයාගත හැක්කේ ඉඳහිට යයි කියා ඔහුගේ පාඨකයන් විශ්වාස කරන බව ය!

සසප අධිරාජ්‍යවාදී යුද්ධයේ තර්ජනය බොහෝ සෙයින් අතිශයෝක්තියට නංවන බව ස්ටයිනර් ප්‍රකාශ කලේ ය. ඔහු මෙසේ ලීවේ යඃ

> 1914 කරා ආපසු යාමක් ලෙස 2014 අධිරාජ්‍යවාදය දැක ගන්නා සසප, මෙම වසන්තය, 1914 වසන්තයේ ආතතීන් යලිත් වේදිකා ගත කරන සමයක් ලෙස ඉතිහාසය පුනර්කරනය වේ යයි ඒත්තු ගෙන සිටී. එහෙත් අඛන්ඩ ව ග්‍රහලෝකය පීඩාවට පත් කලත් අධිරාජ්‍යවාදය, වසර 100කට පැවතියාට වඩා අද බොහෝ සෙයින් වෙනස් ය. උදාහරනයක් ලෙස, ආර්ථික අවශ්‍යතාවලට පිටුබලය දීම සඳහා මිලිටරි බලය යෙදවීම තවමත් සිදු වුවත් සිරියාවේ, ඉරාකයේ හා දැන් යුක්රේනයේ සිද්ධිවලට ඔබාමා පරිපාලනය මුහුන දෙන පැහැදිලි පක්ෂාඝාත ස්වභාවය සාක්ෂි දරන පරිදි, එලෙස මිලිටරි බලය යොදන්නේ ඉතා අකමැත්තෙනි.[4]

අසංවේදීතාවේ හා මුග්ධත්වයේ මෙම ගොබ්බ සුසංයෝජනය බැරෑරුම්ව සැලකීම දුෂ්කර ය. ශතවර්ෂයකට පෙර පැවතියාට වඩා අධිරාජ්‍යවාදය සාමකාමී, හා අනතුරුවලට අකමැති වන තැනට පත්කොට ඇත්තා වූ වෛෂයික වෙනස්කම් ගනන් ගැනීමට ස්ටයිනර් අසමත්ව ඇත. ශතවර්ෂ කාලක් තිස්සේ එක්සත් ජනපදය අනවරත යුද්ධයේ යෙදී සිටින්නේ යයි ඔහු දැකගෙන නැති බව පෙනේ; එහි මිලිටරි මෙහෙයුම් රටවල් පිටින් වනසා දමා ඇති බව ද, ලක්ෂ ගනන් ජනතාව මරා දමා, මිලියන පනහක් දෙනා සරනාගතයන් බවට පත්කොට ඇති බව; මෙන් ම, එහි ඉතිහාසයේ පෙර නුවූ විරූ ආකාරයකින් ගෝලීය පරිමාන ව මිලිටරි බලය යෙදවීමේ නිරත ව සිටින බව. ස්ටයිනර් කියන පරිදි මේ සියල්ල, වසර 100කට පෙර සමයට වඩා "ඉතා අකමැත්තෙන් මිලිටරි බලය යෙදවීම" පිලිබඳ ප්‍රකාශනයන් ද? මූලෝපායික ලේඛන හා ජාත්‍යන්තර මාධ්‍ය තුල පුලුල් ව සාකච්ඡාවට ගැනෙන, භූ-දේශපාලනික හා මිලිටරිමය සත්‍යයක් මිස හුදු සමපේක්ෂනයක් නො වන, එක්සත් ජනපදය, චීනයට හා රුසියාවට එරෙහි ව යුද්ධයක් සූදානම් කිරීම පිලිබඳ කාරනය ගැන කියන්නේ කුමක් ද? ලෝක සමාජවාදී වෙබ් අඩවියේ අනතුරු ඇඟවීම් "අර්බුදවාදී (පිස්සුවක්)" යයි ස්ටයිනර් නො තකා හරියි.

ලෝක දේශපාලනය කෙරෙහි ස්ටයිනර්ගේ සමස්ත ප්‍රවිෂ්ටයම සංලක්ෂිත වන්නේ, ඉතා ම නග්න වර්ගයේ ධාරනාවාදයෙන් ය. ඔබාමා නායකත්වය දෙන්නේ "එක්සත් ජනපද මිලිටරි සම්පත් අවම වසයෙන් කැප

කරන්නා වූ, ඩ්‍රෝන් යානා යෙදවීම වැනි පහසු තෝරා ගැනීම් හැරුනු විට, කිසිදු දීර්ඝ කාලීන මිලිටරි ප්‍රචන්ඩත්වයක යෙදීමට අකමැති, කරන්නේ කුමක්දැයි විශ්වාස නැති දුර්වල පරිපාලනයකට" යයි ඔහු අවධාරනය කරයි.

අධිරාජ්‍යවාදයේ පිලිවෙත් හා ක්‍රියාකාරකම් හැඩගන්වන්නා වූ වෛෂයික බලවේග තුලට මොනම න්‍යායික අභිනිවේෂයක සලකුනක්වත් මෙහි නැත. අධිරාජ්‍යවාදී ආන්ඩුවල අභ්‍යන්තර අර්බුද වනාහි, යුද්ධය පැමිනීම පිලිබඳ ප්‍රධාන ඇඟවුමක් යයි ට්‍රොට්ස්කි, *සංක්‍රමන ක්‍රියාමාර්ගය* තුල පැහැදිලි කලේ ය. "ඓතිහාසිකව වරප්‍රසාදිත සෑම රටක් තුල ම ප්‍රාග්ධනයේ සියලු සාම්ප්‍රදායික පක්ෂ, අධිෂ්ඨාන භංගය අද්දර වැනෙමින් සිටී" යයි ඔහු ලීවේ ය. පාලක ප්‍රභූන් යුද්ධය කරා දුවවන්නේ ඔවුන්ගේ ආත්මීය ආශාවන් නිසා නොව සිය අර්බුදයන්ගෙන් ගොඩ ඒමේ මාවතක් නො දක්නා හෙයිනි. ධනේශ්වරය "ආර්ථික හා මිලිටරි ව්‍යසනයක් කරා දෑස් වසාගෙන රූටා යයි" යනුවෙන් ට්‍රොට්ස්කි සඳහන් කලේ ය.[5]

කිසිදු දේශපාලනික තර්කනයක ගම්‍යයන් තේරුම් ගත නො හැකි ස්ටයිනර්ගේ අධිරාජ්‍යවාදී යුද තර්ජනය නො තකා හැරීම පදනම් වන්නේ, හතරවන ජාත්‍යන්තරය පදනම්වූ, යුගය පිලිබඳ ඇගයීමට මුලුමනින් ම වෙනස් පදනමක බව හඳුනා ගැනීමට ඔහු අසමත් වීම මතය. අධිරාජ්‍යවාදය වෛෂයික ව යුද්ධය කරා තල්ලු නොකරන්නේ නම් හා 1914 හෝ 1939 මෙන් නොව, දැන් එයට සිය කටයුතු වඩා ඉහල සංයමයකින් කලමනාකරනය කර ගත හැකි නම්, ඉන් පෙන්නුම් කරන්නේ ධනවාදී නිෂ්පාදනයේ ගෝලීය ස්වභාවය හා ජාතික රාජ්‍ය පද්ධතිය අතරත්, නිෂ්පාදන බලවේගයන්ගේ සමාජීය ස්වභාවය හා ඒවායේ පුද්ගලික අයිතිය අතරත් අතිමූලික පරස්පර විරෝධයන් සමහන් කරගැනීමේ ක්‍රමයක් එය සොයාගෙන ඇති බව ය. සාර්ථක ව කලමනාකරනය කරන ලද ගෝලීය ධනවාදයක හැකියාව පෙර දුටුවේ කෞට්ස්කි ය. "ආන්තික අධිරාජ්‍යවාදයේ" මෙම නව රූපාකාරය, යුද්ධය ආම්බාන් කර ගැනීමට පාලක පන්තීන්ට හැකියාව දෙනු ඇතැයි ඔහු කියා සිටියේ ය. ප්‍රකටව ඇති තම *අධිරාජ්‍යවාදය: ධනවාදයේ ඉහල ම අවධිය* නමැති කෘතිය තුල ලෙනින් මෙසේ ලීවේ ය:

> ...කෞට්ස්කිගේ "න්‍යායට" තිබිය හැකි එක ම වෛෂයික, එනම් යථා සමාජ අර්ථභාරය, ධනවාදය යටතේ සදාකාලික සාමය තිබිය හැකි යයි ද වර්තමාන යුගයේ උග්‍ර ගැටලුවලින් ද ප්‍රතිසතිතාවන්ගෙන් ද අවධානය ඉවත හැරවීම හා අනාගතයේ "ආන්තික අධිරාජ්‍යවාදයක" හැකියාව පිලිබඳ මායාකාරී බලාපොරොත්තු දෙසට ඔවුන් යොමු කිරීම ද මගින් ජනතාව සැනසීමේ වඩාත් ම ප්‍රතිගාමී ක්‍රමයක් ය යන්න යි. කෞට්ස්කිගේ "මාක්සියානු" න්‍යායයේ තිබෙන එක ම දෙය ජනතාව රැවටීම මිස අන් කිසිවක් නොවේ.[6]

අවස්ථාවාදයට එරෙහිව බොල්ශෙවිකයන් දියත් කල අරගලවල පාඩම් නොතකා හැරීමට මනාප ස්ටයිනර්, අධිරාජ්‍යවාදී වර්ධනයේ කවර අවධියක් හා කවර ක්‍රියාදාමයක් කෞට්ස්කිගේ ඉදිරිදර්ශනය සනාථ කොට ලෙනින් හා ට්‍රොට්ස්කිගේ ඉදිරිදර්ශනය ප්‍රතික්ෂේප කලේදැයි අපට කීමට අසමත් වෙයි.

ග්‍රීසියේ අර්බුදය

2015 ජනවාරි ග්‍රීක මැතිවරනය, ස්ටයිනර් හා බ්‍රෙනර් විසින් මූලික මාක්ස්වාදී දේශපාලන මූලධර්ම ප්‍රතික්ෂේප කිරීමේ තවත් අදියරක් සලකුනු කලේ ය. ගැඹුරු උද්‍යෝගයකින් ඔවුහු, සිරිසාවේ ජයග්‍රහනය හුවාදැක්වූහ. සිරිසාව හා එහි සුලු ධනේශ්වර ව්‍යාජ-වම, සමස්තයක් ලෙස නියෝජනය කරන්නේ, පශ්චාත්-නූතනවාදී න්‍යායයන්, විකාර හා අවස්ථාවාදී වැඩපිලිවෙල හා ඉහල මධ්‍යම පාන්තික සමාජ සංයුතිය යනාදිය වීමේ තතු තුල මෙය විශ්මයට කරුනක් නො වී ය. සිරිසාවේ නායක මන්ඩල හා සංවිධානයේ වාටියෙහි, ස්ටයිනර්ලා හා බ්‍රෙනර්ලා ගනන් නැති සංඛ්‍යාවක් සොයා ගත හැක. සිරිසාවේ ජයග්‍රහනය සැමරීමට හවුල් වීම ජාත්‍යන්තර කමිටුව විසින් ප්‍රතික්ෂේප කිරීමට ස්ටයිනර් හා බ්‍රෙනර් කෝපාවිෂ්ඨ ප්‍රතිචාරයක් දැක්වූහ. සිරිසාවේ ක්‍රියාමාර්ගය පිලිබඳ අපගේ විශ්ලේෂනය හා එය අනිවාර්යයෙන් ග්‍රීක කම්කරු පන්තිය පාවා දෙනු ඇති බවට අප කල අනතුරු ඇඟවීම් ඔවුන්ගේ හෙලා දැකීමට ලක් විය. 2015 පෙබරවාරි 2දා පලකල ලිපියක බ්‍රෙනර්, මැතිවරනයෙන් පසුව *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* නිකුත් කල ප්‍රකාශන කෝපයෙන් උපුටා දැක්වී ය:

> සිරිසාවටත් එහි ධනේශ්වර-ගැති න්‍යාය පත්‍රයටත් දෙන සහාය සාධාරනීකරනය කිරීමට සුලු ධනේශ්වර ව්‍යාජ-වම ඉදිරිපත් කරන දේශපාලනික නිදහසට කරුනු, එනම් සිප්‍රාස් ආන්ඩුව කම්කරු පන්තියට නැතුවම බැරිවූ " අත්දැකීමක්" බවත් ඒ තුලින් කම්කරුවන් කෙසේ හෝ අව්‍යාජ සමාජවාදී පිලිවෙත්වල අවශ්‍යතාව අවබෝධ කර ගනු ඇති බව, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව අවඥාසහගත ව ප්‍රතික්ෂේප කරයි.
>
> එවැනි විතන්ඩවාදයන් ඉදිරිපත් කරන්නේ, වෙහෙස නො බලා සිරිසාව දේශපාලනික ව හෙලිදරව් කිරීම හරහා පමනක් සිදුවිය හැකි, කම්කරු පන්තියේ විප්ලවවාදී ව්‍යාපාරයක

> ඉස්මතු වීමට විරුද්ධවයි. ග්‍රීසිය තුලත් ජාත්‍යන්තරවත් කම්කරුවන් හා තරුනයන් මුහුන දෙන තීරනාත්මක අරගල සඳහා ඔවුන් සූදානම් කිරීමට *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* එකී කර්තව්‍යය භාරගනී.[7]

ව්‍යාජ-වමේ තවත් තර්කයක් වන්නේ, කම්කරු පන්තියට සිරිසාවේ අත්දැකීම් හරහා ගමන් කර ඉන් ඉගෙනගත හැකි බැවින්, එයට සහයෝගය දිය යුතු බව යි. මෙය තනිකරම නරුමත්වය යි. සිරිසා ආන්ඩුවකින් ඇති කල හැකි යෝධ අන්තරායන් හමුවේ, මාක්ස්වාදී පක්ෂයක කර්තව්‍යය වන්නේ සිරිසාව නියෝජනය කරන පන්ති අවශ්‍යතා හෙලිදරවුකොට, එහි විපාක පිලිබඳ ව අනතුරු අඟවා කම්කරු පන්තියට පැහැදිලි සමාජවාදී දිශානතියක් සම්පාදනය කිරීම යි.

ඇදහීමට වඩාත් ම අපහසු යයි සලකන වාක්‍යාංශ තමන් ඇල කොට දක්වා ඇතැයි සඳහන් කරන බ්‍රෙනර්, ජනවාරි 28දා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* පලකල දෙවන ප්‍රකාශනයක් උපුටා දැක්වී යː

> ග්‍රීසිය තුල "අත්දැකීම්වලට" ලෝක සමාජවාදී වෙබ් අඩවිය හා හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සහභාගි වන්නේ මෙලෙසිනි. *නොයෙකුත් ව්‍යාජ-වාම කන්ඩායම් සිරිසාවේ එල්ලී සිටින්නේ ඒවා ද එම පක්ෂය නියෝජනය කරන පන්ති අවශ්‍යතා ම නියෝජනය කරන හෙයිනි. ඔවුන් කතා කරන්නේ කම්කරු පන්තියේ ස්වාධීන ව්‍යාපාරයකට බිය වන, එමෙන් ම ධනේශ්වර පර්යාය තුල තමන්ගේ ම සමාජීය ප්‍රගමනය පිලිබඳ ව උනන්දු වන මධ්‍යම පන්තියේ වඩා ධනවත් කොටස් වෙනුවෙනි.*[8]

මෙයට ප්‍රතිචාර ලෙස බ්‍රෙනර්, "මෙම උද්ධෘතයන් දෙකම මාක්ස්වාදීන් කට්ටිවාදය යයි කියන දෙයට නිදසුන්" වන බව පැවසීය. ඔහු තම මාක්ස්වාදී මූලාශ්‍රයන්හි නම් සම්පාදනය කලේ නැත. පැහැදිලිවම එම මූලාශ්‍රවලට මාක්ස්, එංගල්ස්, ලෙනින් හා ට්‍රොට්ස්කි අයත් නො වෙති. මන් ද යත්, කම්කරු පන්තිය, ධනේශ්වරයට දේශපාලනික ව යටත් කිරීම සඳහා ක්‍රියාකල සියලු අවස්ථාවාදී පක්ෂ හා ප්‍රවනතාවල වඩාත් ම අශමනීය විරුද්ධවාදීන් වූයේ ඔවුන් බැවිනි. ධනේශ්වර ආන්ඩුවක් -නිශ්චිත ව ම සිරිසාව එවන් ආන්ඩුවකට නායකත්වය දෙයි- හෙලිදරවු කිරීම හා එයට විරුද්ධ වීම කට්ටිවාදය නම්, විප්ලවීය සමාජවාදී ව්‍යාපාරයක් ලෙස මාක්ස්වාදයේ සමස්ත ඉතිහාසය, දීර්ඝ හා අඳුරු "කට්ටිවාදයේ" වංශකතාවක් වන අතර එහි ප්‍රමුඛ නියෝජිතයෝ අන් කවරෙක්වත් නොව, ලෙනින් හා ට්‍රොට්ස්කි ය.

සිරිසා ආන්ඩුවට විරුද්ධ වීම නිසා ජාත්‍යන්තර කමිටුව හෙලා දකිනු ලැබීම සමාන වන්නේ, මෙන්ශෙවික්වාදයට හා දෙවන ජාත්‍යන්තරයට එරෙහි ව ලෙනින්ගේ අරගලය, ස්ටැලින්වාදී "මහජන පෙරමුනුවාදයට" එරෙහි ව ට්‍රොට්ස්කිගේ අරගලය සහ ස්ටැලින්වාදී හා ධනේශ්වර ජාතිකවාදී සංවිධානවලට පැබ්ලෝවාදීන් යටත් වීමට ජාත්‍යන්තර කමිටුව විරුද්ධ වීම තුල ප්‍රකාශනය අත්පත් කරගත් දේශපාලන මූලධර්ම ප්‍රතික්ෂේප කිරීමට යි. ඔවුන් දැන් පදනම් වන ආස්ථානයන්හි සිට ස්ටයිනර්ට හෝ බ්‍රෙනර්ට, තමන් 1970 ගනන් මුල වර්කර්ස් ලීගයට සම්බන්ධ වූයේ ඇයිදැ'යි විස්තර කල නො හැක. ඒ සමයේ දී පැබ්ලෝවාදියෝ එක දිගට ම ජාත්‍යන්තර කමිටුව "අති වාමාංශික කට්ටිවාදීන්" ලෙස හෙලා දුටහ.

ස්ටයිනර් හා බ්‍රෙනර් ලියන සියල්ල, ට්‍රොට්ස්කි වෙහෙස නො තකා සටන් වැදුනු මූලධර්මවලට විරුද්ධ ය. *සංක්‍රමන ක්‍රියාමාර්ගයේ* අර්ථභාරය පිලිබඳ ව ඇමරිකානු ට්‍රොට්ස්කිවාදීන් සමග 1938 දී පැවති සාකච්ඡාවල දී ට්‍රොට්ස්කි අවධාරනය කලේ, විප්ලවවාදී පක්ෂ ක්‍රියාමාර්ගයේ ආරම්භක ලක්ෂ්‍යය විය යුත්තේ එහි සියලු ආතතීන් සහිත ධනවාදයේ වෛෂයික අර්බුදය මිස කම්කරුවන්ගේ ආත්මීය විඥානය හා ව්‍යාකූලත්වය නො වන බව යි. ජේම්ස් පී. කැනන් හා ඇමරිකානු ශාඛාවේ අනෙකුත් නායකයන් සමග 1938 මැයි මාසයේ පැවති හමුවක දී ට්‍රොට්ස්කි මෙසේ පැවසීයː

> ඇමරිකානු කම්කරු පන්තියේ දේශපාලන පසුගාමීත්වය දැවැන්තය. එහි අර්ථය, ෆැසිස්ට් ව්‍යසනයක අනතුර ද සුවිසල් බව යි. අපගේ සකල ක්‍රියාකාරීත්වය සඳහා ආරම්භක ලක්ෂ්‍යය ද එය යි. ක්‍රියාමාර්ගයෙන් ඉදිරිපත් කල යුත්තේ කම්කරු පන්තියේ වෛෂයික කර්තව්‍යයන් මිස ඔවුන්ගේ පසුගාමීත්වය නො වේ. ඉන් පිලිබිඹු කල යුත්තේ ඒ හැටියට පවත්නා සමාජය මිස කම්කරුවන්ගේ පසුගාමීත්වය නො වේ. ක්‍රියාමාර්ගය වනාහි පසුගාමීත්වය පරාජය කර එය ජයගන්නා උපකරනයකි.[9]

ජනතාවගේ ව්‍යාකූලත්වයට හා අගතීන්ට පොහොර දැමීමට එරෙහිව ඇමරිකානු නායකයන් සමග පැවති සාකච්ඡාවල දී ට්‍රොට්ස්කි මෙසේ අනතුරු ඇඟවී යː

> …මහජන මනෝගතිය වෛෂයික සාධකයන්ට ගැලපීම අපගේ කර්තව්‍යය යි… අප කටයුතු කල යුතු පදනම ලෙස පවතින්නේ, සමාජයේ අර්බුදය යි. අපගේ ක්‍රියාකාරීත්වයේ දේශපාලන කරලිය, (සමාජ) මනෝගතිය යි. අප එය වෙනස් කල යුත්තෙමු. සමාජය පිලිබඳ

විද්‍යාත්මක විග්‍රහයක් ඉදිරිපත් කල යුතු අපි එය මහජනයාට පැහැදිලිව විස්තර කල යුත්තෙමු. මාක්ස්වාදය හා ප්‍රතිසංස්කරනවාදය අතර වෙනස එය යි.

ප්‍රේක්ෂකයන්ට අවශ්‍ය කුමක් ද යන්න ගැන හොඳ ඉවක්, නෝමන් තෝමස් වැනි ප්‍රතිසංස්කරනවාදීන් සතුව ඇති අතර ඔවුහු එය සපයති. එහෙත් එය බැරෑරුම් විප්ලවවාදී ක්‍රියාකාරීත්වය නො වේ. "ඔබලා මෝඩයෝ ය", "ඔබලා තකතීරුවෝ ය", "ඔවුහු ඔබලා පාවා දෙති" යනුවෙන් පැවසීමට හා ජනප්‍රිය නො වීමට ද අපගේ අදහස් අනුරාගී ලෙස ගෙන හෙලා දැකීමට පාත්‍ර වීමට අපට ධෛර්ය තිබිය යුතු ය. කලින් කල කම්කරුවා සසල කර අපගේ ක්‍රියාමාර්ගය විස්තර කිරීම ද පසුව යලිත් සෙලවීම ද අවශ්‍යය. ඒ සියල්ල අයත් වන්නේ ප්‍රචාරන කලාවට යි. එහෙත් එය විද්‍යාත්මක විය යුතු අතර මහජන මනෝගතියට නැමිය නො යුතු ය.[10]

ඇමරිකානු කම්කරුවන් සමාජවාදී විප්ලවයේ ක්‍රියාමාර්ගය පිලිගැනීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ෆැසිස්ට්වාදයේ වැඩපිලිවෙල පිලිගැනීමේ අන්තරායට ඔවුන් මුහුන පාන බව ඇමරිකානු ව්‍යාපාරයේ නායකයන්ට ට්‍රොට්ස්කි අනතුරු ඇඟවී ය. නියමිත කාලයේ දී කම්කරුවන් ක්‍රියාකාරී වනු ඇතැයි සහතිකයක් නැත. "අපට මෙහි වගකීම භාරගත නො හැකි ය. අපට වගකිව හැක්කේ අප ගැන පමනය." ට්‍රොට්ස්කි පැවසී ය.[11]

ස්ටයිනර් හා බ්‍රෙනර් කිසිවක් පිලිබඳ ව වගකීම භාර නො ගනිති. ධනේශ්වර දේශපාලන පක්ෂයකට හා එය නායකත්වය දෙන ආන්ඩුවට තමන් දෙන සහයෝගය සාධාරනීකරනය කිරීම සඳහා ඔවුන් කම්කරු පන්තියේ "අත්දැකීම" යන්නෙහි පිහිට පතන්නේ, එය පන්ති බලවේගවල බලපෑමට ලක් නො වන, නිෂ්ක්‍රීයව හා ගෞරවනීය නිශ්ශබ්දතාවෙන් යුතුව නිරීක්ෂනය කල යුතු මානසික ප්‍රපංචයක් වන්නාක් මෙනි. වෛෂයික ඓතිහාසික ක්‍රියාවලිය පිලිබඳ අපෝහකය තුල, "චලනයේ හා උත්පාදනයේ මූලධර්මය"[12] ක්‍රියාකරවන නිෂේධනයේ තීරනාත්මක සංරචකය වන විප්ලවවාදී පක්ෂයේ සවිඥානික ක්‍රියාකාරීත්වය දිගහැරෙන සමාජ අත්දැකීමෙන් බැහැර කල යුතු යයි සියල්ලට ඉහලින් ඔවුහු අවධාරනය කරති. ඇත්තවශයෙන්ම ස්ටයිනර් හා බ්‍රෙනර් තර්ක කරන්නේ, අපවිත්‍ර අහිංසකත්වයේ ශුද්ධවූ මානසික තත්ත්වයට විවේචනාත්මක විශ්ලේෂනය හා විසංවාදී හෙලිදරවු කිරීම සමගින් බලහත්කාරයෙන් කඩා වැදීමට අවසර දිය නො හැකි බව යි. අත්දැකීම "අවමානයට" පත් නො කල යුතු ය. ඒ වෙනුවට, "අත්දැකීමට" තමන් කැමති තැනකට, එනම් පරාජය කරා, කම්කරුවන් දැක්කීමට ඉඩ දිය යුතු ය.

ස්ටයිනර් හා බ්‍රෙනර්ගේ "අත්දැකීම" පිලිබඳ අවස්ථාවාදී න්‍යායයේ දේශපාලන බංකොලොත්කම පසුකාලීන වර්ධනයන් මගින් හෙලිදරවු කරනු ලැබ ඇත. ඔවුන්ගේ මංමුලාවට හා දේශපාලනික යටත් වීමට ඇලෙක්සිස් සිප්රාස් වන්දිය ගෙව්වේ, අන්ත දක්ෂිනාංශික ධනේශ්වර පක්ෂයක් වන ස්වාධීන ග්‍රීක පක්ෂය සමග සංධානගත ව ආන්ඩුවක් තනමිනි. ඉන්පසුව සිප්රාස්, යුරෝපා සංගමයේ කප්පාදු වැඩපිලිවෙලට විරුද්ධ ව සිරිසාව දී තිබුනු සෑම පොරොන්දුවක් ම කඩකිරීමේ පිලිවෙතක් ඔස්සේ ගමන් කලේය.

සිරිසාවේ පාවාදීම

යුරෝපා සංගමයේ නියෝගවලට තම ආන්ඩුවේ යටත් වීම දේශපාලනිකව වසං කිරීම සඳහා සිප්රාස් විසින් 2015 ජූලි 5දා පැවැත්වූ ජනමත විචාරනය මෙම පාවාදීමේ කූටප්‍රාප්තිය විය. කප්පාදු පියවරවලට විරුද්ධ බව කියා සිටිමින් යන්තම් මාස පහකට පෙර බලයට පත් සිරිසා ආන්ඩුවට, තමන් යුරෝපා සංගමයට යටත් විය යුතු ද නැද්ද යන්න තීරනය කිරීම සඳහා ජනමත විචාරනයක් කැඳවීමට යුක්ති සහගත හේතුවක් නැති බව පෙන්වමින් ජාත්‍යන්තර කමිටුව මෙම උපාමාරුව හෙලා දැක්කේ ය. යථාර්ථයේ දී සිප්රාස් කලේ, යුරෝපීය අධිරාජ්‍යවාදයට හා ග්‍රීක පාලක ප්‍රභූවේ එහි මිතුරන්ට, කප්පාදු පිලිවෙත් ක්‍රියාවට නැගීමේ වගකීමෙන් සිරිසාව නිදහස් කිරීම සඳහා තම ආන්ඩුව බලයෙන් පහ කිරීමට අවස්ථාව සලසා දීමකි.

විය හැකිව තිබූ පරිදි ම, සිප්රාස්ගේ උපාමාරුව පිලිබඳ ජාත්‍යන්තර කමිටුවේ හෙලිදරවු කිරීමෙන් කෝපයට පත් බ්‍රෙනර්, සිප්රාස්ගේ ආරක්ෂාව වෙනුවෙන් ඉදිරිපත් විය. සිරිසාව, "ග්‍රීක ජනතාව දෙසට හැරී තව තවත් කප්පාදු වලට පක්ෂ ද විපක්ෂ ද යන්න තීන්දු කරන ලෙස ඉල්ලා ඇත... මෙය වනාහි ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය තමන් කී දේ කල දුර්ලභ අවස්ථාවන්ගෙන් එකකි"[13] යි හෙතෙම ලිවීය.

බ්‍රෙනර් එතරම් ම කටුක ලෙස විරෝධය පලකල, ජාත්‍යන්තර කමිටුවේ අනතුරු ඇඟවීම් ඉක්මනින්ම සනාථ විය. සිප්රාස් පෙර නොදක්නා ලද හා අකැමති වූ දැවැන්ත "නැත" යන ඡන්දයෙන් තැති ගත්තේය. බ්‍රිතාන්‍යයේ *ඩේලි ටෙලිග්‍රාෆ්* පුවත්පතේ ජාත්‍යන්තර ව්‍යාපාරික කර්තෘ ඇම්බ්‍රෝස් එවන්ස්-ප්‍රිට්චාඩ් විසින් ලියන ලදු ව, 2015 ජූලි 8දා පලකල ලිපියක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* විශ්ලේෂනය තහවුරු කලේ ය:

විදේශීය පාලනයට එරෙහි ප්‍රබල ජාතික කැරැල්ලකට නායකත්වය දීම කෙසේ වෙතත් ග්‍රීක අගමැති ඇලෙක්සිස් සිප්රාස්, ආර්ථික හා මූල්‍ය සංගමයේ ඇප කොන්දේසි පිලිබඳ ව ඉරිදා පැවැත්වූ ජනමත විමසුමෙන් ජයගැනීමට පවා කිසිවිටෙක අපේක්ෂා නො කලේ ය.

ඔහු හදිසියේම ජනමත විචාරනය කැඳවූයේ එය පරාජය වනු දැකීමේ අපේක්ෂාව හා අභිලාෂය ඇතිව ය. සැලැස්ම වූයේ හොඳ සටනක් දී, ගෞරවාන්විතව පරාජය පිලිගෙන, යුරෝපීය ආයතනවල ජූනි 25 "අවසන් නිවේදනය" ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් අයට ඉඩ ලබාදෙනු පිනිස, මැක්සිමෝ මාලිගාවේ යතුරු භාර දී පරිභවය විඳ ගැනීම යි. [14]

යුරෝපා සංගමය සමග සාකච්ඡාවලට නායකත්වය දුන් සිරිසාවේ හිටපු මුදල් ඇමති යානිස් වරුෆාකිස්, *ගාඩියන්* පුවත්පත 2015 ජූලි 14දා පල කල හමුවක දී, එවන්ස්-ප්‍රිට්චාඩ්ගේ වාර්තාව සනාථ කලේ ය. " අගමැතිවරයා ද සිතන්නට ඇතැයි මා විශ්වාස කල පරිදි, මා සිතාගෙන සිටියේ, අපගේ සහයෝගය හා නැත යන ඡන්දය පුලුල්ව නැගීඑන වේගයකින් මැකී යනු ඇත කියා ය"යි වරුෆාකිස් *ගාඩියන්* පුවත්පතට කීවේ ය. සිරිසාවේ දන ගැසීමෙන් වාසිය ලබනු ඇත්තේ ගෝල්ඩන් ඩෝන් නමැති ග්‍රීක ෆැසිස්ට්වාදී පක්ෂය බව ද ඔහු කීවේ ය. "ගෝල්ඩන් ඩෝන් පක්ෂය තවත් ශක්තිමත් වීම මිස වෙනත් ප්‍රතිඵලයක් මට දැකගත නො හැක." [15]

ස්ටයිනර් හා බ්‍රෙනර්, සිරිසාව විසින් ග්‍රීක කම්කරු පන්තිය පාවා දෙනු ලැබීමට ප්‍රතිචාර දැක්වූයේ, සිරිසාව හා එහි නායක ඇලෙක්සි සිප්රාස් හෙලා දකිමින් නො ව, *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* එරෙහි වඩ වඩාත් කර්කශ ප්‍රහාර එල්ල කරමිනි. *ලෝසවෙඅ* සිදු කල අපරාධය නම්, "ජනතාවගේ දේශපාලන විඥානය ඉහල දැමීම සඳහාත්, වඩා විශාල පිරිසක් විප්ලවීය සමාජවාදය වෙත දිනා ගැනීමට ඉඩ සැලසීම සඳහාත්, සිරිසා ආන්ඩුව පිලිබඳ අත්දැකීම එකහෙලා ප්‍රතික්ෂේප කිරීම යි." [16] මෙම විකාර සහගත තර්කය අප යොමු කරන්නේ, කම්කරු පන්තිය අවමංගත කොට දිරිසුන් කරන දේශපාලන පාවාදීම්, විඥානයේ වර්ධනය සඳහා කරන ධනාත්මක ප්‍රතිපදාන ලෙස නිගමනය කොට සාදරයෙන් පිලිගැනීම කරාය. පාවදීම් වැඩිවන තරමට හොඳ ය! මෙම පාවාදීම් ගෝල්ඩන් ඩෝන්හි ජයග්‍රහනයට මග පෑදුවහොත් සිදුවනු ඇත්තේ කුමක් ද? ස්ටයිනර් හා බ්‍රෙනර්ගේ දේශපාලන තර්කනය අප පිලිගන්නේ නම්, එය ද විඥානය ඉහල දමන තවත් වටිනා අත්දැකීමක් වනු ඇත! ඔවුන්ගේ විඥානය පිලිබඳ න්‍යායයට අනුව, "සමාජවාදීන්ගේ" කර්තව්‍යය වන්නේ කම්කරු පන්තිය පාවාදෙන පක්ෂ කෙරෙහි මිථ්‍යාවන් දිරිගැන්වීම යි. අයෙක් "කම්කරුවන්ගේ අත්දැකීම් සමග සිටගත" යුතු ය. [17] ග්‍රීසිය තුල ප්‍රතිගාමීත්වය ජයගතහොත්, මැන්හැටන්හි ස්ටයිනර් හා ටොරොන්ටෝහි බ්‍රෙනර් නිසැක ව ම කම්කරුවන් සමග "සිටගනු" ඇති අතර ඔවුන් එසේ කරනු ඇත්තේ ඇතැන්ස්හි සිට සැතපුම් 5,000ක පමන ආරක්ෂා සහිත දුරක සිට ය.

සිය දිරිසුන්කම තවත් අනාවරනය කරන ප්‍රකාශයක් තුල බ්‍රෙනර් මුග්ධ ලෙස මෙසේ පවසයි: "විප්ලවවාදී දේශපාලනයේ දී සත්‍යය ප්‍රකාශ කරමින් සිටීම පමනක් සෑහෙන්නේ නැත." [18] පිලියම් කල නො හැකි ලෙස නරුමත්වයෙන් දූෂනයවූ, සමාජවාදයට තමන්ගේ සියලු බුද්ධිමය හා සදාචාරාත්මක බැඳීම් අත්හල පුද්ගලයෙකුට පමනක් මෙම වචන ලිවිය හැක. මාක්ස්වාදය හා සකල වර්ගයේ ප්‍රගතිශීලී චින්තනය හා සංස්කෘතිය ආවේශ ගැන්වෙන්නේ, සත්‍යයට වඩා ප්‍රබල කිසිවක් නැත යන ඒත්තුගැනීමෙනි. තම පැවැත්ම සඳහා ධනවාදය බොරු මත පදනම් වන යුගයක සත්‍යය සඳහා කරන අරගලයේ යෝධ දේශපාලන අර්ථභාරය මත හතරවන ජාත්‍යන්තරය යොදන අවධාරනය හේතුවෙන්, සමාජවාදය සමග යම් සබඳතාවක් ඇතැයි කියා සිටින ව්‍යාපාර ද ඇතුලු අනෙකුත් සියලූ දේශපාලන ව්‍යාපාරවලින් එය වෙන් වේ. 1937 දී ට්‍රොට්ස්කි වඩාත් ප්‍රබල ලෙස මෙසේ ප්‍රකාශ කලේ ය: "තර්ජන, චෝදනා හෝ (නිදහස) උල්ලංඝනය කිරීම මගින් අප නවතාලිය නො හැක! එය සුදුපැහැ ගැන්වෙන අපගේ අස්ථි මත තිබියදී පවා සත්‍යය ජයගනු ඇත! අපි එහි මං සලකුනු දීප්තිමත් ව දල්වන්නෙමු. එය ජයගනු ඇත!" [19] සියල්ලට මත් වඩා කම්කරු පන්තියට සත්‍යය ප්‍රකාශ කිරීම ලෙස අර්ථවත් වන සත්‍යය සඳහා අරගලය, මාක්ස්වාදී දේශපාලනයේ අත්‍යවශ්‍ය පදනම වන අතර එය සකලාකාර දේශපාලන අවස්ථාවාදයේ රූපාකාරයන් සමග නො පෑහේ.

ස්ටයිනර් හා බ්‍රෙනර් සිරිසාව ආරක්ෂා කිරීම, ඔවුන් ජාත්‍යන්තර කමිටුව හෙලා දැකීමට යටින් පවතින බුද්ධිමය අවිශ්වාසය, න්‍යායික වංචනිකත්වය හා දේශපාලනික දෙපිටකාට්ටුකම හෙලිදරව් කර ඇත. 2004 දී ඔවුන් තම ප්‍රහාරය ආරම්භ කලේ, ප්ලෙඛනොව්ගේ කාර්යභාරය කෙරෙහි මගේ ඉමහත් ගෞරවය තුලින් පැන නගින "වෛෂයිකවාදී" ප්‍රවනතා හා "අපෝහකය නො තකා හැරීම", ජාත්‍යන්තර කමිටුවේ හුදු පැවැත්ම ම අනතුරේ හෙලන ආකාරයට මාක්ස්වාදී න්‍යායයෙන් පිටමංවීමක් යයි චෝදනා කරමිනි. මගේ "වෛෂයිකවාදය" පිලිබඳ ඔවුන්ගේ විවේචන පිලිගැනීමට අසමත් වීම මගින් විප්ලවවාදී ව්‍යාපාරයක් ලෙස ජාත්‍යන්තර කමිටුවේ පැවැත්ම අවසන් ව ඇතැයි ඔවුහු 2007 වනවිට නිගමනය කොට තිබුනි. ඔවුන්ගේ උද්ඝෝෂනය ආරම්භ කිරීමෙන් දශකයකට පසුව දැන්, ස්ටයිනර් හා බ්‍රෙනර්

වැඩකරන්නේ, කම්කරු පන්තිය බිහිසුනු ලෙස පාවා දී ඇති සුලු ධනේශ්වර දේශපාලනඥයන්ගේ ආසක්ත සහචරයින් ලෙස ය.

## සවාස් මයිකල්-මට්සාස්ගේ පුනරාගමනය

දේශපාලනය උපහාසයන්ගෙන් පොහොසත් ය. තවමත් ජාත්‍යන්තර කමිටුව කෙරෙහි පක්ෂපාතීත්වය ප්‍රකාශ කරමින් සිටි 2004 දී, ස්ටයිනර් ලියූ ආරම්භක විවාදාත්මක ලිපිය තුල ඔහු කියා සිටියේ, ජෙරී හීලිගේ "අපෝහකය පිලිබඳ ග්‍රාම්‍යකරනය" පිලිබඳ ව ජාත්‍යන්තර කමිටුවේ විවේචනයෙහි වැදගත්කම තමන් හඳුනාගත් බව යි. "ජාත්‍යන්තර කමිටුව පූර්න විනාශයකින් වලක්වාලීය යන අරුතින්, 1985 දී හීලි සමග සිදු වූ භේදය වැදගත් සැතපුම් කනුවකි."[20] ඔහු පිලිගත්තේ ය.

එහෙත් ජාත්‍යන්තර කමිටුවට එරෙහි අරගලය හා සිරිසාව ආරක්ෂා කිරීමේ තර්කනය, ස්ටයිනර් හා බ්‍රෙනර් ගෙන ගොස් ඇත්තේ, 1985 දී කොන්දේසි විරහිත ව හීලිට සහාය දී ජාත්‍යන්තර කමිටුවෙන් බිඳුනු සවාස් මයිකල්-මට්සාස් සමග දේශපාලන සංධානයක් ඇතිකර ගැනීම දෙසට ය. ඔහු වනාහි හීලිට සහාය දැක්වූ එකම ජාත්‍යන්තර කමිටු ශාඛාව වන ග්‍රීසියේ කම්කරු ජාත්‍යන්තර සංගමයේ ජාතික ලේකම් ය. මයිකල්-මට්සාස් හීලිට සහාය පලකලේ පුද්ගලික පක්ෂපාතිත්වයක් නිසා නො ව, හීලිගේ අවස්ථාවාදී පිලිවෙත්, ග්‍රීසිය තුල ස්ටැලින්වාදී හා වාම ධනේශ්වර පක්ෂ සමග දේශපාලන සංධානයන් තනාගැනීමට මට්සාස්ම දැරූ උත්සාහය සමග සමීප ව බැඳී තිබුනු හෙයිනි. ජාත්‍යන්තර කමිටුවෙන් බිඳී ගිය පසු, මයිකල්-මට්සාස්, ට්‍රොට්ස්කිවාදය "වියුක්ත ප්‍රචාරකවාදයෙන්" හා "පරාජයන්ගේ භාවිතයෙන් හා හුදකලාවීමෙන්" මුදා ගන්නා ලද "හතරවන ජාත්‍යන්තරය සඳහා නව යුගයක්" ප්‍රකාශයට පත් කලේ ය. භාවිතයේ දී මෙම " නව යුගය" සමන්විත වූයේ, ග්‍රීසිය තුල ධනේශ්වර පැසොක් පක්ෂයට සහාය දීම, ස්ටැලින්වාදීන් සමග සංධානගතව සයිප්‍රසය තුල ධනේශ්වර ජනාධිපති අපේක්ෂකයෙකුට අනුමැතිය පල කිරීම හා මිහයිල් ගොර්බචෙව්ගේ පෙරස්ත්‍රොයිකා වැඩපිලිවෙල සෝවියට් සංගමය තුල "දේශපාලන විප්ලවයේ" ආරම්භය ලෙස වගවර්නනා කිරීමෙන්ය.

මයිකල්-මට්සාස් ජාත්‍යන්තර කමිටුවෙන් බිඳී තිස් වසරකට පසු, ස්ටයිනර් හා බ්‍රෙනර් සිය වෙබ් අඩවියේ අවකාශය, "කට්ටිවාදී" ජාත්‍යන්තර කමිටුව හෙලා දැකීම සඳහා භාවිතා කිරීම පිනිස ඔහුගේ සේවයට කැපකොට ඇත. හජාජාක හා ලෝසවෙඅ ට "සිරිසා නායකත්වයේ ධනේශ්වර ස්වභාවය ගැන යම් නිවැරදි දේවල් කිව හැකි නමුත් ඔවුන් සිරිසා ජයග්‍රහනයේ අර්ථභාරය නො සලකා හරී... මහජන ව්‍යාපාරය කෙරෙහි පවතින නො තැකීම නිසා කට්ටිවාදී කන්ඩායම් විවෘත වන අවස්ථාවන් කෙරෙහි අන්ධ වෙති."[21] සියලු දේශපාලන අවස්ථාවාදීන් මෙන් මයිකල්-මට්සාස් ද නායකත්වයේ පන්ති ස්වභාවය හා දේශපාලන ක්‍රියාමාර්ගය අර්ථ දැක්වීමකින් තොරවම "මහජන ව්‍යාපාරයට" වැඳ වැටෙයි.

මයිකල්-මට්සාස් ජාත්‍යන්තර කමිටුවෙන් බිඳුනු තැන් පටන් ඔහුගේ න්‍යායික සංකල්පවල පරිනාමය ගැන ඔහුගේ විකිපීඩියා සටහන අපට මෙසේ දන්වා සිටී:

"විප්ලවවාදී න්‍යාය හා මාක්ස්වාදය, ගැලවුම්කාරයාගේ හා යුදෙව් මිථ්‍යාපුරානයේ ඉදිරිදර්ශනයෙන් හා අනෙක් අතට යලි අර්ථකථනය කිරීමට" ඔහු ප්‍රයත්න දරමින් සිට ඇත. ඔහුගේ ආස්ථානය එක්කෝ "ආගමික අදේවවාදයක්" නැතහොත් " ගැලවුම්කාරයෙක් ගැන විශ්වාස නොකිරීම" ලෙස වර්ග කල හැක.[22]

මයිකල්-මට්සාස්ගේ "අපෝහකය ග්‍රාම්‍යකරනය" පිලිබඳ ව එකදු විවේචනාත්මක වචනයක් හෝ ස්ටයිනර්-බ්‍රෙනර් බ්ලොග් අඩවිය තුල යමෙක් සොයා නො ගනු ඇත. අප ජීවත්වන්නේ "පශ්චාත්-මාක්ස්වාදී" යුගයක ය යන සිරිසා දෘෂ්ටිවාදීන්ගේ කියමන් වලින් මෙන් ම, මාක්ස්වාදය තුලට කබලාගේ මධ්‍යකාලීන ගුඪවාදය රිංගවීමට මයිකල්-මට්සාස් දරන උත්සාහයෙන් ද ඔවුහු කරදරයට පත් නො වෙති. එහෙත් මගේ "වෛෂයිකවාදී" දර්ශනය, එනම් කම්කරු පන්තියේ අවශ්‍යතා අනාවරනය කොට ඉදිරිපත් කිරීම සඳහා ඓතිහාසික භෞතිකවාදී විශ්ලේෂනය උපයෝගී කරගැනීම, ස්ටයිනර්ට හා බ්‍රෙනර්ට ඉවසිය නො හැක.

අප යලිත් කිව යුත්තේ, ඔවුන්ගේ දර්ශනය ඔවුන්ගේ දේශපාලනය මෙහෙයවන්නේ නැති බව යි. ඒ වෙනුවට ඔවුන්ගේ දේශපාලනය තුල ප්‍රකාශිත වන පන්ති දිශානතිය හා සමාජ අවශ්‍යතා වලින් ඔවුන්ගේ ආත්මීය හා සාරසංග්‍රහවාදී දර්ශනවාදය පැන නගී.

## ව්‍යාජ-වම පිලිබඳ අර්ථකථනයක්

සිරිසාවේ පාවාදීම ග්‍රීසිය තුල හා ජාත්‍යන්තරව අර්ථභාරී සැතපුම් කනුවක් සලකුනු කරයි. "වාමවාදී" වංචනික දෙඩවිලි හැරෙන්නට, සිරිසා වැනි සංවිධාන පැන නැගුනු සමාජ පරිසරයේ කිසිවක්, ඉතිරි ව නැත. තම කප්පාදු-විරෝධී ක්‍රියාමාර්ගය තමන් විසින් ම ප්‍රතික්ෂේප කිරීම, මධ්‍යම පන්තියේ වරප්‍රසාදිත කොටස්වල දේශපාලන නියෝජිතයින් හා වැඩ කරන ජනතාවන් අතර නො පෑහිය හැකි ආගාධය අනාවරනය කොට තිබේ. සමාජ අවශ්‍යතාවන්ගේ මෙම වෛෂයික සට්ටනය, අවශ්‍ය දේශපාලනික යලිසන්ධානගත වීමක් පනගන්වනු ඇත.

ව්‍යාජ-වමට විරුද්ධ ව හැරෙනු ඇති කම්කරු පන්තියේ හා තරුනයන්ගේ දියුනු කොටස්, අව්‍යාජ සමාජවාදී හා මාක්ස්වාදී වාමාංශය කරා මාවත සොයා ගැනීමට වෙහෙසෙනු ඇත. සමාජ හා දේශපාලන බිඳී වෙන්වීමේ මෙම වෛෂයික ක්‍රියාදාමයට, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ මැදිහත් වීම අවශ්‍ය ය. පාවා දුන්නවුන් කෙරෙහි හුදු කෝපය ප්‍රමානවත් නො වේ. කම්කරුවන්ගේ රැඩිකලීකරනයට හා පන්ති අරගලයේ තීව්‍ර වීමට, ඉහල මට්ටමේ දේශපාලන හා ඓතිහාසික විඥානයක් ඇතුලු කිරීමට මාක්ස්වාදීන් වෙහෙස දැරිය යුතු ය.

මෙම ක්‍රියාදාමයට ප්‍රතිපදානයක් ලෙසත් තමන්ගේ දේශපාලන සතුරන් හඳුනාගැනීමට කම්කරුවන්ට උදවු වීම සඳහාත්, අද්‍යතන ව්‍යාජ-වම පිලිබඳ ව අපි පහත දැක්වෙන ක්‍රියාකාරී අර්ථ දැක්වීම ඉදිරිපත් කරමු:

- ව්‍යාජ-වම යන්නෙන් හැඳින්වෙන්නේ, මධ්‍යම පන්තියේ වරප්‍රසාදිත හා සෞභාග්‍යමත් කොටස්වල සමාජ-ආර්ථික අවශ්‍යතා පෙරට ගෙන යාමට, ජනතාවාදී සටන් පාඨ හා ප්‍රජාතාන්ත්‍රික දෙඩවිලි උපයෝගී කරගන්නා, දේශපාලන පක්ෂ, සංවිධාන හා න්‍යායික/දෘෂ්ටිවාදාත්මක ප්‍රවනතා ය. එවැනි පක්ෂ හා ප්‍රවනතාවලට උදාහරන නම්, ග්‍රීසියේ සිරිසාව, ස්පාඤ්ඤයේ පොදේමොස්, ජර්මනියේ ඩි ලින්කේ වැනි ගනන් නැති හිටපු ට්‍රොට්ස්කිවාදී (එනම් පැබ්ලෝවාදී) අංකුර සහ ප්‍රන්සයේ නව ධනේශ්වර විරෝධී පක්ෂය (එන්පීඒ), ශ්‍රී ලංකාවේ නව සම සමාජ පක්ෂය හා එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සමාජවාදී සංවිධානය වැනි රාජ්‍ය ධනවාදී පක්ෂය. අරාජකවාදී හා පශ්චාත්-අරාජකවාදී ප්‍රවනතාවල බලපෑමට යටත් වූ "වාඩිලාගැනීමේ" ව්‍යාපාරවල සුන්බුන් හා ඒවායින් පැවත එන්නන් ද මෙම ලැයිස්තුවට ඇතුලත් කල හැකිය. ලොව පුරා විවිධාකාර සුලු-ධනේශ්වර ව්‍යාජ-වාම සංවිධාන කෙතරම් පැතිර ඇත් ද යත්, මෙය කිසිසේත් ම පරිපූර්න ලැයිස්තුවක් නො වේ.

- ව්‍යාජ-වම ප්‍රති-මාක්ස්වාදී වේ. ඓතිහාසික භෞතිකවාදය ප්‍රතික්ෂේප කරන ඔවුන් ඒ වෙනුවට, සාංදෘෂ්ටිකවාදය, ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය හා අද්‍යතන පශ්චාත්-නූතනවාදය සමග අනන්‍ය වන ආත්මීය විඥානවාදයේ හා දාර්ශනික අහේතුකවාදයේ විවිධ රූපාකාර වැලඳ ගනී.

- සමාජවාද-විරෝධී හා පන්ති අරගලයට එරෙහි වන ව්‍යාජ-වම, සමාජයේ ප්‍රගතිශීලී පරිවර්තනය සඳහා විප්ලවයේ අවශ්‍යතාව හා කම්කරු පන්තියේ කේන්ද්‍රීය ක්‍රියාකලාපය ප්‍රතික්ෂේප කරයි. [23] ධනේශ්වර පද්ධතියට එරෙහි ව කම්කරු පන්තිය දේශපාලනික වසයෙන් ස්වාධීන ව සංවිධානය කිරීම හා මහජන බලමුලුගැන්වීමට විරුද්ධ වන ව්‍යාජ-වම, පන්තිවලට උඩින් පන්ති බෙදීම් රහිත ජනතාවාදය පිහිටුවයි. සාරාර්ථයෙන් ම ව්‍යාජ-වමේ ආර්ථික වැඩපිලිවෙල, ධනේශ්වර-ගැති හා ජාතිකවාදී වේ.

- ජාතිකත්වය, වාර්ගිකත්වය, ස්ත්‍රී-පුරුෂ භාවය හා ලිංගික යොමුව ආදියට සම්බන්ධ ගැටලු වලට ඇලී ගැලී සිටින ව්‍යාජ-වම, "අනන්‍යතා දේශපාලනය" ඔජවඩවන්නේ, ජනගහනයේ ධනවත් ම සියයට 10 අතර ධනය තමන්ට වඩා වාසි සහගත ආකාරයකට බෙදා හැරීමට, මහා සංගත, පාඨශාලා හා විශ්ව විද්‍යාල, ඉහල වැටුප් සහිත වෘත්තීන්, වෘත්තීය සමිති හා ආන්ඩුවේ හා රජයේ ආයතන ආදිය තුල වඩා වැඩි බලපෑමක් අත් කර ගැනීමේ අටියෙනි. ව්‍යාජ-වම තතනන්නේ සමාජ වරප්‍රසාද අහෝසි කිරීම වෙනුවට ඒවා වෙත වඩා වැඩි ප්‍රවේශයක් සඳහා මාවත පාදා ගැනීමට යි.

- උතුරු ඇමරිකාව, බටහිර යුරෝපය හා ඕස්ට්‍රේලියාව යන අධිරාජ්‍යවාදී මධ්‍යස්ථානවල දී අධිරාජ්‍ය-ගැති ව්‍යාජ-වම, නව විජිතවාදී මෙහෙයුම් සාධාරනීකරනය කිරීමට මෙන් ම ඒවාට සහයෝගය දීමටත් "මානව හිමිකම්" පිලිබඳ සටන්පාඨ පිටුපස සැඟවෙයි.

කම්කරු පන්තියට උගන්වා, සුලු ධනේශ්වර සංවිධානවල බලපෑමෙන් එය විමුක්ත කරගෙන, නූතන ධනවාදී සමාජය තුල කේන්ද්‍රීය ප්‍රගතිශීලී හා විප්ලවවාදී බලවේගය ලෙස එය ස්ථාපනය කිරීමට, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය ගෙනයන අරගලයේ දී, එය මුහුන දෙන විශේෂයෙන් තීරනාත්මක කර්තව්‍යයන් වන්නේ, ව්‍යාජ-වමේ පන්ති පදනම, පරිහානිගත න්‍යායික සංකල්ප හා එහි ප්‍රතිගාමී දේශපාලනය විශ්ලේෂනය කොට හෙලිදරවු කිරීම යි. ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය, පශ්චාත්-නූතනවාදය හා ව්‍යාජ-වමේ දේශපාලනය, එම කර්තව්‍යය කරා ලඟා වන ප්‍රතිපදානයක් වෙතැයි අපේක්ෂා කෙරේ.

**ඩේවිඩ් නෝර්ත්**

**ඩිට්‍රොයිට්, එම්අයි**

**2015 ජුලි 16**

**සටහන්**

1. ප්ලෙඛනොව් ගේ *Selected Philosophical Work* දාර්ශනික කෘති වල තුන්වන වෙලුමේ (මොස්කව් 1976) 483 වන පිටුවේ "එච්. රිකට් ගේ පොත" නම් ලිපිය තුල ප්ලෙඛනොව්, එච්. රිකට් යොදාගත් වාක්‍යාංශ තරමක් අවඥාසහගත ව උද්ධෘත ලකුනු තුල බහා දක්වයි. සාත්‍රේ

ගේ, මර්කූස් ගේ සහ ෆොකොල්ට් වැනි පසු කාලීන අතර්කවාදීන්ට බරපතල ලෙස බලපෑ, නාසි පන්දම්කාර අස්තිත්වවාදී දාර්ශනික මාර්ටින් හෙයිඩගර් තම චර්යාව ඇරඹුවේ, රිකට් ගේ සහකරු ලෙස බව සටහන් කිරීම වටනේ ය.

2. http://forum,permanent-revolution.org2014/10/about/this/web/site,html.

3. http://forum.permanent-revolution.org/2014_05_01_archive.html

4. http://forum.permanent-revolution.org/2014/09/a-brief-comment-on-resolution-of-sep-on.html [අවධාරනය අපේ]

5. *සංක්‍රමන ක්‍රියාමාර්ගය: ධනවාදයේ මරලතෝනිය හා හතරවන ජාත්‍යන්තරයේ කර්තව්‍යයෝ,* (කොළඹ, කම්කරු මාවත ප්‍රකාශන, 1988), 1 පිටුව.

6. වී. අයි. ලෙනින්, *Imperialism, the Highest Stage of Capitalism,* අධිරාජ්‍යවාදය, ධනවාදයේ උච්ඡතම අවධියයි, (නිව් යෝක්: ඉන්ටර්නැෂනල් පබ්ලිෂර්ස්, 1970), 118 පිටුව.

7. www.wsws.org/en/articles/2015/01/27/pers-j27.html [බ්‍රෙනර්ගේ අවධාරනය]

8. www.wsws.org/en/articles/2015/01/28/syri-j28.html [බ්‍රෙනර්ගේ අවධාරනය]

9. *The Transitional Program for Socialist Revolution* , සමාජවාදී විප්ලවය සඳහා සංක්‍රමන ක්‍රියාමාර්ගය, (නිව් යෝක්: පාත් ෆයින්ඩර්, 1977), 189-190 පිටු

10. එම, 219 පිටුව

11. එම., 191 පිටුව

12. *Marx-Engels Collected Works , Volume 3,* මාක්ස්-එංගල්ස් එකතු කල කෘති, 3 වෙලුම (නිව් යෝක්: ඉන්ටර්නැෂනල් පබ්ලිෂර්ස්, 1975), 332 පිටුව

13. http://forum.permanent-revolution.org/2015/06/the-working-class-in-fantasy-and-reality.html

14. http://www.telegraph.co.uk/finance/economics/11724924/Europe-is-blowing-itself-apart-over-Greece-and-nobody-can-stop-it.html

15. http://www.theguardian.com/business/2015/jul/14/golden-dawn-will-be-strengthened-by-worse-austerity-yanis-varoufakis-warns

16. http://forum.permanent-revolution.org/2015/07/sectarianism-and-greek-working-class.html [Emphasis in the original]

17. එම

18. එම, (මුල්කෘතියේ අවධාරනය)

19. ලියොන් ට්‍රොට්ස්කි, *I Stake My Life,* ජීවිතය පරදුවට තබමි, (නිව් යෝක්: ලේබර් ප්‍රකාශන, 1977), 26 පිටුව

20. http://permanent-revolution.org/polemics/dialectical_path.pdf

21. http://forum.permanent-revolution.org/2015/01/for-revolutionary-intervention-in.html

22. https://en.wikipedia.org/wiki/Savas_Matsas

23. "දැන් අර්බුදයට මුහුන දී ඇත්තේ, එක් සමාජයක සිට තවෙකකට පරිවර්තනය වීමේ ආරම්භක මොහොත ලෙස කැපිටල් 'ආර්' අකුර සහිත ව විප්ලවය තුල කම්කරු පන්ති භූමිකාවේ භවයේ කේන්ද්‍රීයත්වය සහිත සමාජවාදය පිලිබඳ සමස්ත සංකල්පය යි" යනුවෙන් *Hegemony and Socialist Strategy,* (ආධිපත්‍යය (හෙජමොනිය) සහ සමාජවාදී මූලෝපාය) යන කෘතිය තුල අර්නස්ටෝ ලැක්ලාව් හා ෂන්තාල් මූෆ් ලිවී ය. (ලන්ඩන්: වර්සෝ, 2001), 2 පිටුව.

© www.wsws.org